# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/39 - 2018 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ජා-ඇල හා ඒකල මළනල පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 09 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1362

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 191 කනුවන ග්‍රාම නිලධාරී වසමේ ජා-ඇල ගමේ පිහිටි, සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 24.75ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | හිස් ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | මිනුවන්ගොඩ පාර ; |
| *දකුණට* | ඃ | සතොස හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | ඃ | වාහන විකුණුම් මධ්‍යස්ථානය හා නිවස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ*යූසුප් මහතා (ලිපිනය සොයාගත නොහැක)

06-659


1A - G 27776 — 29 (2018/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1984/19 හා 2016.09.13 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියමයේ උපලේඛනයේ මායිම් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1221

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇළ සහ අබ්දුල් කෆූර් මොහොමඩ් වසීර් හිමිකම් කියන කලුගලතැන්න වත්ත ; |
| *නැගෙනහිරට* | : | අබ්දුල් කෆූර් මොහොමඩ් වසීර් හිමිකම් කියන කලුගලතැන්න වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා) ; |
| *දකුණට* | : | මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ රජය හිමිකම් කියන කලුගලතැන්න වත්ත ; |
| *බටහිරට* | : | රජය හිමිකම් කියන කලුගලතැන්න වත්ත. |

06 -660